# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,554 — 1965 නොවැම්බර් 12 වැනි සිකුරාද — 1965.11.12

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස—ඉඩම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| **ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :—** | |
| ප්‍රාරම්භක දැන්වීම් ... ... ... | — |
| අවසාන නියෝග ... ... ... | — |
| **ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... ... | — |
| මධ්‍යම පළාත ... ... ... | — |
| දකුණු පළාත ... ... ... | — |
| උතුරු පළාත ... ... ... | — |
| නැගෙනහිර පළාත ... ... ... | — |
| වයඹ පළාත ... ... ... | — |
| උතුරු මැද පළාත ... ... ... | — |
| ඌව පළාත ... ... ... | — |
| සබරගමු පළාත ... ... ... | — |
| **ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... ... | — |
| මධ්‍යම පළාත ... ... ... | — |
| දකුණු පළාත ... ... ... | — |
| උතුරු පළාත ... ... ... | — |
| නැගෙනහිර පළාත ... ... ... | — |
| වයඹ පළාත ... ... ... | — |
| උතුරු මැද පළාත ... ... ... | — |
| ඌව පළාත ... ... ... | — |
| සබරගමු පළාත ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් ... ... | 641 |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් ... ... | 646 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් ... ... | 646 |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම ... ... | — |


## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

1965 අංක 312 දරණ ආඥාව

ජේ. 63/64 ඊ. 1047

යොමු අංකය :—
ඉඅ/3/121

1964 අංක 28 දරණ ඉඩම අත්කර ගැනිමෙ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම අත්කර ගැනිමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ඉඩම් අත්කර ගැනිමේ නිලධාරියාට නැත හොත් එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනිමට මෙයින් නියම කරමි.

සි. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

කොළඹ, 1965 ඔක්තෝබර් 11 දින.

#### උපලේඛනය

| I<br>ඉඩම අත්කර ගැනිමේ නිලධාරියා | II<br>ඉඩමේ විස්තරය |
|---|---|
| කළුතර දිස්ත්‍රික්කයේ උප දිසාපති. | කළුතර දිස්ත්‍රික්කයේ, ගඟබඩ පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොටසේ වෙල්ගම ග්‍රාම සේවක කොටසේ, වෙල්ගම ගමේ පිහිටි වෙල්ගම වතුයාය නැමති පහත සඳහන් මායිම් තුල පිහිටි අක්කර දෙකක් පමණ වූ බිම් කොටස.<br><br>උතුරට : වෙල්ගම වතුයායේ කුඹුර, වතුපාර සහ පිට ඇලක් ; නැගෙනහිරට : වෙල්ගම වතුයායේ කුඹුර සහ අඩි පාරක් රක්ෂිත බිම ; දකුණට : අඩි පාරක්, රක්ෂිත බිම, පොල්ලේගොඩ වෙල්ගම සිට මෝල්කැව පරගොඩ යන ගම් සභා පාර හා පිට ඇලක් ; බටහිරට : පිට ඇලක්. |

11–313—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 1965 අංක 314 දරණ ආඥාව

ජේ. 58/59 ඊ. 633.
යොමු අංකය :———————
කියුබ් 550.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත් එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම, ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

කොළඹ, 1965 ඔක්තෝබර් 20 දින,

උපලේඛනය

| I<br>ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා | II<br>ඉඩමේ විස්තරය |
|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති. | කොළඹ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ (බී) කොට්ඨාශයේ, දාසිය පත්තුවේ, වීගොඩ ගමේ පිහිටි, ප්‍රමාණයෙන් අ. 1, රූ. 0, පර්. 25.0 ක් වූ කෝන්ගහවත්ත නැමැති බිම් කැබලි 4 ක්. මෙම බිම් කැබලි 4 නො. 77 මූලික සිතියමේ බිම් කැබලි අංක 1, 2, 3 සහ 4 ලෙස මැන වෙන් කර ඇත. |

11-310—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කෝට්ටේ-ගල්කිස්ස ගම්කායයි සභා සීමාව තුළ බොරලැස්ගමුවේ පිහිටි "ලේක්වීව්" නැමැති ඉඩමෙන් අ. 0, රූ. 2, ප. 5ක් පමණ ප්‍රමාණය ඇති බිම් කැබැල්ලට මායිම් :—

උතුරට : දෙහිවල-මහරගම ප්‍රසිද්ධ පාර ;
නැගෙනහිරට : වී. මූ. දෙන් හේරිස් සහ තවත් අය හිමිකම් කියන බොරලැස්ගමුව වැව පාරේ ව. අ. 243 දරණ ඉඩම ;
දකුණට හා බටහිරට : එම ඉඩමේ ඉතිරි කොටස.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක : ජේ. 64/65 ඇල්පී 349.—ආර්/කිව්. 489.

1965 ඔක්තෝබර් 15 දින,
කොළඹ දිය.

11-321—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර හේවාගම් කෝරළයේ, මැද පත්තුවේ, පහළ පාදුක්ක පිහිටි දෙල්ගහවත්ත නැමැති ඉඩමෙන් අඩි 100×15ක පමණ විශාලකම් ඇති බිම් තීරුවට මායිම් :—

උතුරට සහ නැගෙනහිරට : දෙල්ගහවත්ත නමැති ඉඩමේ කොටසක් ;
දකුණට : දේවගේ මාවත ;
බස්නාහිරට : දෙල්ගහවත්ත නමැති ඉඩමේ කොටසක්.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක ජේ. 64/65 ඇල්පී 254/කිව්ර් 243

1965 ඔක්තෝබර් මස 14 දින, කොළඹදී ය.

11-408—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, ලක්ෂපතියේ පිහිටි නැකිරිදෙනියවත්ත නැමැති පර්චස් 33ක් (120×75) පමණ විශාලකම් ඇති ඉඩම් කැබැල්ලට මායිම් :—

උතුරට : පොන්සේකා පාර ;
නැගෙනහිරට : සෝත්‍රාරාම මහ විහාර පාර ;
දකුණට : සෝත්‍රාරාම මහ විහාර භූමිය ;
බස්නාහිරට : සෝත්‍රෝදන විද්‍යාල භූමිය.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක ජේ. 64/65 ඊ 308/කිව්.ඊ297

1965 ඔක්තෝබර් මස 21 දින, කොළඹදී ය.

11-407—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙසින් ප්‍රකාශ කරමි.

කළුතර දිස්ත්‍රික්කයේ, ගඟබඩ පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ වෙල්ගම ග්‍රාමසේවක කොට්ඨාසයේ, වෙල්ගම ගමේ පිහිටි වෙල්ගම වතුයාය නමැති පහත සඳහන් මායිම තුළ පිහිටි අක්කර දෙකක් පමණ වූ බිම් කොටස:—

උතුරට: වෙල්ගම වතුයායේ කුඹුර, වතුපාර සහ පිට ඇලක්;
නැගෙනහිරට: වෙල්ගම වතුයායේ කුඹුර සහ අඩි පාරක්, රක්ෂිත බිම;
දකුණට: අඩි පාරක්, රක්ෂිත බිම, පෙලේගොඩ වෙල්ගම සිට මෝල්කාව පාරගොඩ යන ගම්සභා පාර හා පිට ඇලක්;
බටහිරට: පිට ඇලක්.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක ජේ. 63/64ඊ. 1047—ඉඅ/3/121

1965 ඔක්තෝබර් මස 11 දින, කොළඹදී ය.

11-405—65.11.12 දින අංක 14,554 දරණ ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙසින් ප්‍රකාශ කරමි.

කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කොළඹ නාගරික සීමාව තුළ කොට්ඨාශ අංක 26—කොල්ලුපිටියේ අල්විස් පෙදෙසේ අක්. 0, රූඩ 0, පර්. 25ක් පමණ විශාල වූ ම. අංක 34/5 දරණ ඉඩම් කෙටසට මායිම:—

උතුරට: පී. පී. ඒ. 4812 අංක 3 දරණ කැබැල්ල;
නැගෙනහිරට: පී. පී. ඒ. 4812 අංක 3 සහ වරිපනම් අංක 30 දරණ ඉඩම;
දකුණට: ම. අංක 30 දරණ ඉඩම;
බටහිරට: පී. පී. ඒ. 4812 අංක 3 දරණ ඉඩම සහ වරිපනම් අංක 30 දරණ ඉඩම.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක ජේ 64/65 එල් ජී 379—ආර්/කිව්. 492.

1965 ඔක්තෝබර් මස 27 දින කොළඹ දී ය.

11-361—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙසින් ප්‍රකාශ කරමි.

කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, කොළඹ නාගරිකයේ කුරුඳුවත්ත කොට්ඨාශයේ පිහිටි, දැනට හැව්ලොක් තුරග තරග පිටිය නමින් හැඳින්වෙන අංක 505, 524, 2649, 2439 දරණ බදු සැලැස්මයන් සහ අංක 1275 දරණ බදු චක්‍ර සටහනද අනුව රජයේ බදුකර පිට භුක්ති විඳින සර්වේ ජෙනරල් විසින් සකස් කරන ලද අංක 18 දරණ රජයේ ඉඩම් සැලැස්මේ (සී.එල්.පී.) අංක 1 සිට 8 දක්වා ඇති බිම් කැබලි තුළ පිහිටියාවූ අක්කර 93, රූඩ. 3, පර්චස් 9.49 ක් පමණ වූ සම්පූර්ණ බිම් ප්‍රමාණය සහ එහි ඉදි කර ඇති සියළුම ගොඩනැගිලි.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක ජේ 64/65 ඊ 453 ආර්/කිව් 502.

1965 සැප්තැම්බර් මස 30 දින කොළඹ දී ය.

11-362—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වෙනි වගන්තියේ යටතේ දැන්වීමයි

අංකය: කිව්සී/234/කේ.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙසින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:—

මූලික සැලැස්මේ අංකය: කො. 66; ගම: දන්ගල්ල.

කැබැල්ල: 1.

ඉඩමේ නම: කැලගහවත්ත; විස්තර: අවු. 30-35වූ පොල්ගස් 53, අවු. 30-35වූ කොස්ගස් 5, අවු. 30-35වූ කජුගස් 19, අවු. 30-35වූ දෙල්ගස් 3, අවු. 20වූ ගොඩපොරගස් 6, අවු. 25වූ ගොඩපොරගස් 2, අවු. 20වූ පුවක්ගස් 20, අවු. 15වූ රබර්ගස් 118ක් ඇති ඉඩම; අයිතිකම් කියන අය: ජේ. ඒ. ආරොන් සිංඤෝ, ජේ. ඒ. ඩිදිරිස් සිංඤෝ, ජේ. ඒ. බ්‍රම්පි සිංඤෝ, ජේ. ඒ. ජෝන් සිංඤෝ, ජේ. ඒ. පොඩිනෝනා, ජේ. ඒ. පොඩිඅප්පුහාමි, ජේ. ඒ. ප්‍රේමදාස, ජේ. ඒ. සෝමසිරි, ජේ. ඒ. පියදාස, සියළුදෙනාම, දන්ගල්ල, පැපිලියවල; ප්‍රමාණය: අ. 1, රූ. 2, ප. 05.7.

ඉහත සඳහන් ඉඩමට හිමිකම, අයිතිවාසිකම හෝ වෙනත් සම්බන්ධකම කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965.12.30 වැනි දින පූ. භා. 9ට කොළඹ කච්චේරියේදී මා හමුවිය යුතුයි.

තවද, 1965 දෙසැම්බර් 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බලු හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඩී. රාජරත්නම්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි තැන.

1965 නොවැම්බර් 4 වැනි දින,
කොළඹ කච්චේරිය.

11-419—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධනය වූ ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වෙනි වගන්තියේ යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මූලික සැලැස්මේ අංක කො. 88 ; ගම : බැද්දේගෙදර මුල්ල.

කැබලි අංක : 1.

ඉඩමේ නම : කහටගහවත්ත ; විස්තර : අවු. 6ක් වූ රබර්ගස් 273ක් ඇති රබර් ඉඩම ; අයිතිකම් කියන අය : සිරියාවතී ඩයස්, ජයසූරිය, 66, මීගොඩ ; ප්‍රමාණය : අ. 1, රූ. 1, ප. 21.1.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965. 12. 21 වැනි දින පූ. භා. 9.30ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965 දෙසැම්බර් 14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා ඇති සියළු ඔප්පු සහ අනිකුත් ලියකියවිලි පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි.

අ. පු. බ. මනම්පේරි,
ආණ්ඩුවේ අතිරේක උප දිසාපති,
කොළඹ දිස්ත්‍රික්කය.

අංකය : කිවර්. 255
1965 නොවැම්බර් මස 4 වැනි දින,
කොළඹ කච්චේරිය.

11-417—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශොධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි.

යොමු අංකය : ඇල් ඩී/ඒ—73

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ පාත දුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පල්ලේගම්පහ කෝරලේ දොරගමුව ගමේ පිහිටා ඇති දෙරගමුවේ පදිංචි ඇන්. යූ. නංචිචී අම්මා, හෙම්මාතගම බුලත්ගම පදිංචි ඇන්. යූ. සිලම්බේ, ගම්පොල අඹුලාවත්තේ පදිංචි ඇන්. යූ. වල්ලිඅම්මා යන අය විසින් හිමිකම් කියනු ලබන අංක මහ. 56 දරණ මූලික සැලැස්මේ අංක 1 වශයෙන් විස්තර කර ඇති ප්‍රමාණයෙන් අක්කර 4, රූඩ් 3, පර්චස් 12.5ක් වූ ඊරියගස් අංගේවත්ත නොහොත් ඕබිල්ලාවේවත්ත නැමැති ඉඩම් කැබැල්ල.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965-12-13 වැනි දින අ. භා. 3.30 ට මහනුවර කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965 දෙසැම්බර් මස 6 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද, එකී ඉඩම සම්බන්ධයෙන් අයිතිවාසිකම් තහවුරු කිරීම පිණිස හා ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් ඇති සියලුම ඔප්පු හා ලියකියවිලි මෙම විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඇස්. මාරලන්ද,
ආණ්ඩුවේ උප දිසාපති, මහනුවර දිස්ත්‍රික්කය.

1965 ඔක්තෝබර් 28 වැනි දින,
මහනුවර කච්චේරිය.

11-357—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වෙනි වගන්තියේ යටතේ දැන්වීමයි

යොමු අංකය : ඇල් ඩී/ඒ. 150

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ පාත හේවාහැට ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ හේවාවිස්ස කෝරළේ, උඩපිටිය ගමේ පිහිටා ඇති දෙල්තොට පල්ලේගම පට්ටියගම, උඩපිටියේ පී. ඇම්. අමිනා උම්මා විසින් හිමිකම් කියනු ලබන අංක ඒ 3149 දරණ මූලික සැලැස්මේ අංක 1 හා 2 වශයෙන් මැන විස්තර කර ඇති ප්‍රමාණයෙන් අක්. 0, රූ. 3, පර්. 38.8ක් වූ උලහිටියතැන්න පතන නොහොත් බත්ගලා වත්ත සහ උලහිටියතැන්න පතන නැමැති ඉඩම් කැබලි දෙක.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965. 12. 13 වැනි දින අ. භා. 3.15ට මහනුවර කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965 දෙසැම්බර් 6 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද, එකී ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම පිණිස හා ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් ඇති සියලුම ඔප්පු හා ලියකියවිලි මෙම විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඇස්. මාරලන්ද,
ආණ්ඩුවේ උප දිසාපති,
මහනුවර දිස්ත්‍රික්කය.

1965 ඔක්තෝබර් 28 වැනි දින,
මහනුවර කච්චේරිය.

11-358—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වෙනි වගන්තියේ යටතේ දැන්වීමයි

මගේ අංකය : ඇල් ඩී/ඒ 103.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, උඩගම්පහ කෝරළේ, සිරිමල්වත්ත, පල්ලේගම්මැද්ද ගමේ පිහිටා ඇති ගුන්නෑපාන, සිරිමල්වත්ත පදිංචි එච්. ඇම්. ලොකු මැණිකේ, ඩී. ඒ. අත්තනායක, ඩී. අත්තනායක. මාරස්සන, බෝපිටිය විදුහලේ අමරාවතී අත්තනායක. පේරාදෙණිය, ඊරියගම අඩවලව්වේ පදිංචි සෝමාවතී අත්තනායක, හා ගුන්නෑපාන සිරිමල්වත්ත පදිංචි ඒ. බී. වීරකෝන්, වී. ඞිංගිරිබන්ඩා යන අය අයිතිකම් කියනු ලබන අංක මහ 19 දරණ මූලික සිතියම් අංක 1, 2, 3 හා 4 වශයෙන් විස්තර කර ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, පර්. 4.5ක් වූ ලිංතොටවෙලේ කුඹුර හා මාලිගාතැන්නේවත්ත නැමැති ඉඩම් කැබලි හතර.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965.12.20 වැනි දින පූ. භා. 9.30ට මහනුවර කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965 දෙසැම්බර් 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභ වයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. එකී ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම තහවුරු කිරීමට හා ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් ඇති සියලුම ඔප්පු හා ලියකියවිලි මෙම විභාගයේ දී ඉදිරිපත් කළ යුතුයි.

ඇස්. මාරලන්ද,
ආණ්ඩුවේ උප දිසාපති,
මහනුවර දිස්ත්‍රික්කය.

1965 ඔක්තෝබර් 29 වැනි දින,
මහනුවර කච්චේරිය.

11-415—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙසින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

හලාවත දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, මූන්තේස්සරම් පත්තුවේ, මරදන්කුලම ගමේ පිහිටි ප්‍රමාණයෙන් අ. 0, රූ. 2, ප. 29.2ක් වූ අංක 1860 දරණ මූලික සැලැස්මේ කට්ටි අංක 1, 2, 3 සහ 4 යනුවෙන් දක්වා ඇති තල්ගහවත්ත නමැති බිම් කට්ටි හතර.

**කට්ටි අංකය : 1.**

ඉඩමේ නම : තල්ගහවත්ත ; විස්තරය : පොල් ඉඩම. අවුරුදු 50ක් වයසැති පොල් ගස් 4ක් හා අවුරුදු 70ක් වයසැති තල් ගසක් ඇත ; අයිතිවාසිකම් කියන්නන් : හලාවත, මරදන්කුලම, ජේ. ඇම්. මානෙල්හාමි, ආර්. එස්. එස්. තන්ගම්මා සහ ආර්. එස්. එස්. පොන්නම්මා ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 25.7.

**කට්ටි අංකය : 2.**

ඉඩමේ නම : තල්ගහවත්ත ; විස්තරය : අවුරුදු 70ක් වයසැති පොල් ගහක් සහිත පොල් ඉඩම ; අයිතිවාසිකම් කියන්නන් : හලාවත, මරදන්කුලම, ආර්. එස්. ඒ. මුත්තයියා සහ කේ තන්ගම්මා; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 23.7.

**කට්ටි අංකය : 3.**

ඉඩමේ නම : තල්ගහවත්ත ; විස්තරය : අවුරුදු 70ක් වයසැති පොල් ගහක් සහිත පොල් ඉඩම ; අයිතිවාසිකම් කියන්නන් : හලාවත, මරදන්කුලම ඒ. වික්ටර් ප්‍රනාන්දු ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 15.2.

**කට්ටි අංකය : 4.**

ඉඩමේ නම : තල්ගහවත්ත ; විස්තරය : අවුරුදු 70ක් වයසැති පොල් ගහක් සහිත පොල් ඉඩම ; අයිතිවාසිකම් කියන්නන් : හලාවත, මරදන්කුලම ඒ. වෙරෝනිකා ප්‍රනාන්දු ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 4.6.

**එකතුව : අ. 0, රූ. 2, ප. 29.2.**

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965 දෙසැම්බර් 17 වැනි දින පූ. භා. 10ට හලාවත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965 දෙසැම්බර් මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

පී. බාලසන්තිරන්,
ආණ්ඩුවේ උප දිසාපති,
පුත්තලම් දිස්ත්‍රික්කය.

1965 නොවැම්බර් 1 වැනි දින,
පුත්තලමේ කච්චේරිය.

11-359—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

### 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙසින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

නැගෙනහිර පලාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කොඩ්ඩියාර් පත්තු ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ මුතූර් (දෙමළ) ගම පිහිටි, අංක පීපී 6007 හි, අංක 3 (ටීපී 377635), සහ පීපී. 5746 හි අංක 3 (ටීපී 354244) සහ 5 (ටීපී 354250) දරණ බිම් කැබැලිවල කොටස්.

(1) ඉඩමේ නම : කර්තිකාඩු ; විස්තරය : ඉඩමේ පොල්ගස් 8 ක් තිබේ ; අයිතිවාසිකම් කියන අය : නයිනා මොහිදින් බාවාගේ උරුමක්කාරයින්, මුතූර් ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 26.

(2) ඉඩමේ නම : කර්තිකාඩු ; විස්තරය : ඉඩමේ පොල්ගස් 6 ක් තිබේ ; අයිතිවාසිකම් කියන අය : පකීර් නයිනා, මුතූර් ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 31.5.

(3) ඉඩමේ නම : වෙඩතුකාඩු ; විස්තරය : මූඩු ඉඩමකි ; අයිතිවාසිකම් කියන අය : ඇස්. විශ්වසියා මිය., මුතූර් ; ප්‍රමාණය : අ. 1, රූ. 0, ප. 02.5.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965 දෙසැම්බර් 9 වැනි දින පූ. භා. 9.30 ට ත්‍රිකුණාමලය දිසාපති කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965 දෙසැම්බර් 7 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඇම්. බී. සේනානායක,
ආණ්ඩුවේ දිසාපති,
ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය.

1965 නොවැම්බර් මස 5 වැනි දින,
ත්‍රිකුණාමලය කච්චේරිය.

11-440—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

යොමු අංකය : ඇල්බී/166/64.

## ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය යටතේ ඉඩම් කට්ටි ලැබීමට සුදුස්සන් තෝරාගැනීම සඳහා ඉඩම් කච්චේරියක් පැවැත්වීමේ නිවේදනයයි

1935 අංක 19 දරණ ඉඩම් සංවර්ධන ආඥාපණත (464 වැනි පරිච්ඡේදය) යටතේ මෙහි පහත "ඒ" උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම් බෙදාදීමට සුදුසු අය තෝරාගැනීම සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිසාපති විසින් ඉඩම් කච්චේරියක් පැවැත්වීමට නියමිතය. ඉඩම් කච්චේරිය පවත්වනු ලබන දිනය සහ ස්ථානය ඉල්ලුම්කරුවන්ට පසුව දැනුම් දෙනු ඇත.

2. මේ සම්බන්ධයෙන් එවනු ලබන සියළුම ඉල්ලුම්පත් පහත "බී" උපලේඛනයෙහි සඳහන් ආකෘති පත්‍රයේ ප්‍රකාර සකස් විය යුතු අතර, එම ඉල්ලුම් පත් "දිසාපති තුමා, දිසාපති කාර්යාලය, ත්‍රිකුණාමලය" යන ලිපිනයට 1965.12.1 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. වෙනත් ස්ථානයන් වෙත යවනු ලබන ඉල්ලුම්පත් භාරගනු නොලැබේ. ඉල්ලුම් පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "පෙරියකුලම" යනුවෙන් සඳහන් කර එවිය යුතුය. "බී" උපලේඛනයේ සඳහන් ආකෘතියේ ප්‍රකාර නොමැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

3. සෑම ඉල්ලුම්කරුවකුම තමා විසින්ම ඉඩම් කච්චේරියෙහිදී පෙනී සිටිය යුතුය. නැතහොත් තමා වෙනුවෙන් පෙනී සිටීමට ලියවිල්ලකින් බලය දුන් නියෝජිතයෙකු පත් කළ යුතුය.

4. ඉඩම් කච්චේරිය පිළිබඳව මෙම නිවේදනයේ සඳහන් නොමැති තොරතුරක් හෝ ඉඩම් බෙදාදීම සම්බන්ධ කොන්දේසි ආදිය පිළිබඳ විස්තර ඉඩම් කච්චේරියෙහිදී ලබාගත හැක.

5. තෝරාගනු ලබන සෑම ඉල්ලුම් කරුවකු විසින්ම ඉඩම් භාරදීමට ප්‍රථම දිසාපතිතුමා විසින් නියම කරනු ලබන වාර්ෂික බදු මුදලක් ගෙවීමට සිදුවනු ඇත.

6. තෝරාගනු ලබන සෑම අයකු විසින්ම ඉඩම් කට්ටිවල භුක්තිය භාරදී තුන් මසක් ඇතුළත අනුමත සැලැස්මට අනුකූලව තමන්ගේම වියදමින් ඉඩම් කට්ටියෙහි ගෙයක් තනා එහි පදිංචිවී, දිසාපති තුමා විසින් සකස් කරනු ලබන වැඩපිළිවෙලට අනුව ඉඩම දියුණු කළ යුතුය. මේ සඳහා රජය විසින් කිසිදු ආධාර මුදලක් පොරොන්දු වනු නොලැබේ.

7. බෙදාදීමට ප්‍රසිද්ධ කර ඇති ඉඩම් අනවසරයෙන් අල්ලාගනු ලබන අයට විරුද්ධව නඩු පවරනු ලබන අතර, ඔවුන් විසින් ඉදිරිපත් කරන ඉල්ලුම්පත් සලකා බලනු නොලැබේ.

8. යම් හේතුවක් නිසා මෙම දැන්වීමේ සඳහන් කිසිදු තොරතුරක් වෙනස්කිරීමට සිදුවුවහොත් ඒ වෙනස් කිරීම් නිසි පරිදි ප්‍රසිද්ධ කරනු ඇත.

9. මෙම ඉඩම් කච්චේරිය, ත්‍රිකුණාමලය, උප්පුවෙලි, නිලාවේලි සහ සාම්බල්තීව් ග්‍රාමසේවක කොට්ඨාශවල යටත් පිරිසෙසින් අවුරුදු 2ක ස්ථිර පදිංචියක් ඇතිව සිටින ඉඩම් නොමැති ගැමියනට පමණක් සීමා වේ.

10. සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉඩම් කච්චේරියේදී පහත සඳහන් දෑ ඉදිරිපත් කළ යුතු වන්නේය:—

(අ) ඉල්ලුම්කරුගේ සහ පවුලේ අනෙකුත් සාමාජිකයන්ගේ වර්තමාන කාණ්ඩයේ සහල් සලාක පොත්.

(ආ) ඉහත 9 වැනි ඡේදයේ සඳහන් පරිදි පදිංචිය සම්බන්ධව දිසාපති තුමා සෑහීමකට පත්වන අන්දමේ සාධක.

(ඇ) මැතිවරණ ඡන්දදායක ලැයිස්තුවේ අනුක්‍රමික අංකය සහ මැතිවරණ දිස්ත්‍රික්කයේ නම. පදිංචිය සම්බන්ධ සාක්ෂි ඉදිරිපත් කිරීම සම්පූර්ණයෙන්ම ඉල්ලුම්කරු සතු වගකීම වන්නේය.

බන්දුල එස්. ද සිල්වා,
දිස්ත්‍රික් ඉඩම් නිලධාරී,
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1965 ඔක්තෝබර් මස 25 වැනි දින,
දිසාපති කාර්යාලය, ත්‍රිකුණාමලය.

### උපලේඛනය "ඒ"

ත්‍රිකුණාමලය-අනුරාධපුර පාරේ 6 සහ 8 වැනි සැතපුම් කනු අතර මහාමාර්ගයේ සිට සැතපුම් දෙකක් පමණ ඇතුළට විහිදී ඇති රජයේ ඉඩම්වල අක්කර 2 බැගින් වූ ගොඩ ඉඩම් කට්ටි. (ඉඩම් සංවර්ධන ආඥාපණත යටතේ හෝ රජයේ ඉඩම් ආඥාපණත යටතේ හෝ ප්‍රදේශයෙහි දැනටමත් බෙදාදී ඇති ඉඩම් හෝ පුද්ගලික ඉඩම් හෝ රක්ෂිත බිම් වලට වැටෙන ඉඩම් මීට අයත් නැත).

### උපලේඛනය "බී"

#### පෙරියකුලම් ව්‍යාපාරය යටතේ ඉඩම් ඉල්ලීමයි

1. ඉල්ලුම්කරුගේ නම :————.
2. ලිපිනය :————.
3. වයස :————.
4. පදිංචිව සිටින ගම සහ පදිංචිව සිටින අවුරුදු ගණන :————.
5. රැකියාව :————.
6. විවාහකද ? එසේනම් යැපෙන දරුවන්ගේ ගණන සහ ඔවුන්ගේ වයස :————.
7. වෙනත් යැපෙන්නන් සහ ඔවුන්ගේ සම්බන්ධය :————.
8. ඉල්ලුම්කරු, බිරිඳ හෝ යැපෙන්නන් නමින් පවතින (රජයේ හෝ පුද්ගලික) ගොඩමඩ ඉඩම් පිළිබඳ විස්තර. (රජයේ ඉඩම් සහ පුද්ගලික ඉඩම් පිළිබඳ විස්තර වෙන වෙනම සැපයිය යුතුයි) :————.
9. රජයේ ඉඩමක අනවසරයෙන් පදිංචිවූවෙක්ද යන වග: එසේ නම් ස්ථානය සහ අනවසරයෙන් පදිංචිවූ දිනය :————.
10. සහල් සලාක පොතේ අංකය :————.
11. සහල් සලාක පොතෙහි සඳහන් ග්‍රාමසේවක අංකය සහ ගෘහ මූලික ලැයිස්තු අංකය :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

11-437—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

මගේ අංකය : ඉ/බ/1/25.

## කළුතර දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම්වල සිහිටි වගාවේ ඵලදාව භුක්ති විඳීමේ බද්ද වෙන්දේසියේ විකිණීමයි

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් රජයේ ඉඩම්වල ඇති වගාවේ ඵලදාව 1966 ජනවාරි මස 1 දින සිට 1966 දෙසැම්බර් මස 31 දින දක්වා භුක්ති විඳීමේ අයිතිය (මින් පසු දිසාපතිතුමා යයි කියැවෙන සියළුම ස්ථානයන්හි කළුතර දිස්ත්‍රික්කයේ දිසාපතිතුමන් හෝ එතුමන් විසින් මෙම බද්ද වෙන්දේසි කිරීම සඳහා බලය පවරනු ලබන නිලධාරී තුමෙකු හෝ ඇතුළත්වන) කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති තුමන් විසින් මෙහි පහත උපලේඛනයේ සඳහන්වන ස්ථානවල දී එහි සඳහන් දිනයන් සහ වේලාවන්හි දී, ප්‍රසිද්ධ වෙන්දේසියේ බදු දෙනු ලබන බව මෙයින් දැනුම දෙනු ලැබේ.

2. එක එක ඉඩම සඳහා තබන ලද ලංසුව මෙහි පහත සඳහන් උපලේඛනයේ ඒ ඒ ඉඩම් ඉදිරියේ සඳහන් කර ඇති ලංසුවට අඩුවෙන් කෙරෙන ඉල්ලීම පිළිගනු නො ලැබේ.

3. සෑම ඉල්ලීමක් ම භාර ගැනීමට පෙර, එම ඉල්ලීමේ සත්‍ය භාවය හා එකී ඉල්ලුම්කරුට, බද්දෙහි සඳහන් කරනු ලබන කොන්දේසි පිළිපැදීමට ඇති හැකියාවන් ගැන දිසාපති තුමන් විසින් සොයා බලනු ඇත. යම් ඉල්ලීමක් එසේ පිළිගත හැකි යයි එතුමන් සෑහීමට පත් නොවුවහොත් එවැනි ඉල්ලීමක් නොකරන ලද සේ සලකා බද්ද දිගට ම වෙන්දේසි කරනු ඇත.

4. වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී, සෑම ඉල්ලුම්කරුවෙකුම තමන්ම හෝ ලියවිල්ලකින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකු මගින් හෝ පෙනී සිටිය යුතුය. නියෝජිතයෙකු මගින් ඉල්ලීම කරනු ලබන සෑම අවස්ථාවක දී ම, වෙන්දේසියේ දී ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා මුලික ඉල්ලුම්කරු විසින් බලය පවරමින් දෙන ලද ලිපි සියළුම නියෝජිතයන් විසින් වෙන්දේසිය පටන් ගැනීමට පෙර දිසාපතිතුමන්ගේ පරීක්ෂාව සඳහා ඉදිරිපත් කළ යුතුය.

5. දිසාපතිතුමන් විසින් පිළිගනු ලබන ඉල්ලීම ඉදිරිපත් කරන ඉල්ලුම්කරු විසින් එසේ ඉල්ලුම් කරන ලද මිලෙන් හරි අඩක් එම ඉල්ලීම පිළිගනු ලැබූ වහාම, එම ස්ථානයේ දී ද, ඉතිරි මුදල, එදින සිට දෙසතියක් ඇතුළත ද, දිසාපති තුමන්ට ගෙවිය යුතුය. එම ඉල්ලුම්කරුට ඉඩම භාරදෙනු ලබන්නේ සම්පූර්ණ මුදල ගෙවූ පසුය. යම් හෙයකින් වෙන්දේසිය අවසන් වූ වහාම පිළිගනු ලැබූ ඉල්ලීම ඉදිරිපත් කළ අයට ඉල්ලූ මුදලින් හරි අඩක් හෝ දෙසතියක් තුළ ඉතිරි හිඟ මුදල හෝ ගෙවීමට නොහැකි වුවහොත්, එම වෙන්දේසිය අවලංගු කොට ඉල්ලුම්කරු එතෙක් ගෙවා ඇති සියළුම මුදල් රාජසන්තක කිරීමට රජයට බලය ඇත.

6. දිසාපතිතුමාට අවශ්‍ය යයි හැඟී නියම කළහොත්, පිළිගනු ලැබූ ඉල්ලීම ඉදිරිපත් කළ ඉල්ලුම්කරු විසින් ඇප මුදලක් තැන්පත් කළ යුතුය. මෙ මුදල කෙසේවත් ඉල්ලුම් කරනලද මුදලෙන් සියයට 10% කට වැඩි නොවිය යුතුය.

7. ඉල්ලුම් කරනලද මුළු මුදල ගෙවූ ඉක්බිති වෙනත් කොන්දේසි සමග පහත සඳහන් කොන්දේසි ද ඇතුළත් බල පත්‍රයක් ඉල්ලුම්කරු නමින් නිකුත් කරනු ලැබේ :—

(1) ඕනෑම අවස්ථාවක මාසයක් කල් දෙමින් ලියවිල්ලක් අවසරපත්‍රකරුට පුද්ගලිකව භාර දීමෙන් හෝ ඔහුගේ හෝ ඇයගේ අවසන් වරට ගත් ලිපිනයට ලියා පදිංචිකළ තැපැලෙන් යැවීමෙන් හෝ බදු දෙන ලද ඉඩමේ පැහැදිළිව පෙණෙන ස්ථානයක අලවා තැබීමෙන් හෝ මෙ බද්ද එසේ කල් දෙනු ලැබූ මාසය අවසන අවලංගු කළ හැක.
(2) අවසර පත්‍රයෙන් ලැබෙන බලය අවසර පත්‍ර දරන්නාට පමණක් සීමාවේ.
(3) ඉඩම් වෙනුවෙන් ගෙවිය යුතු බදු, අයබදු, වරිපනම් ආදී සියළුම වැය මුදල් අවසරපත්‍රකරු විසින් ගෙවිය යුතුය.
(4) අවසර පත්‍ර කරු විසින් ඉඩමෙ තිබෙන් මායිම් සහ මායිම් ගල් යනාදිය සුරක්ෂිතව තබා ගත යුතුවා පමණක් නොව ඒ වෙනුවෙන් වැය වන යම් මුදලක් ඇත්නම් ඔහු විසින් දැරිය යුතුය.
(5) දිසාපතිතුමාගේ කැමැත්ත පළමුවෙන් ලියවිල්ලකින් ලැබ මිස, අවසරපත්‍රකරු ඉඩමෙ වැවෙන ගස් කැපීම හෝ කැපීමට ඉඩදීම, ඒවාට අලාභහානි කිරීම හෝ අලාභහානි කිරීමට ඉඩදීම නොකළ යුතුයි.
(6) දිසාපතිතුමාගේ කැමැත්ත පළමුවෙන් ලියවිල්ලකින් ලැබ මිස, පස් හෝ බොරළු ඉවත් කිරීම නොකළ යුතුයි.
(7) දිසාපතිතුමාගේ කැමැත්ත පළමුවෙන් ලියවිල්ලකින් ලැබ මිස, අවසරපත්‍රකරු විසින් ඉඩමෙ ස්ථිර හෝ අර්ධ ස්ථිර ගොඩනැගිලි ඉදි කිරීම නොකළ යුතුය.
(8) ඉඩම් කොමසාරිස්තුමාගේ කැමැත්ත පළමුවෙන් ලියවිල්ලකින් ලැබ මිස, මෙ අවසර පත්‍රය මත බදුකරුට ලැබෙන හිමිකම් අතුරු බද්දක් පිට දීමට හෝ පැවරීමට හෝ උගස් කිරීම හෝ වෙනත් මොනම ක්‍රමයකින් හෝ අන් සතු කිරීම ඔහු විසින් නොකළ යුතුය.
(9) අවසරපත්‍රකරු විසින් ඉඩමේ වගාව ආරක්ෂා කළ යුතුය. යම්කිසි දෙයක් නැතිවීම හෝ සොරකම් කිරීම හෝ ගින්නෙන් හෝ වෙනත් විධියකින් අලාභහානි සිදුවීමට ඉඩ තැබීම වැලැක්විය යුතු බවත් මොනම කරුණක් නිසා හෝ වන්දි ඉල්ලීමට අවසරපත්‍රකරුට මොනම අයිතියක් හෝ නොමැත.
(10) දිසාපතිතුමා හෝ ඔහු විසින් බලය දී ඇති නිලධාරියෙකුට ඕනෑම වේලාවක ඉඩමට ඇතුළ් වී එය පරීක්ෂා කිරීමට ඉඩ දිය යුතුය.
(11) මෙම බද්ද අවසන් වීමට ප්‍රථම මුළු ඉඩම හෝ එහි යම්කිසි කොටසක් රජයට අවශ්‍ය වුවහොත් අවසරපත්‍රකරු විසින් මුළු ඉඩම හෝ එහි යම්කිසි කොටසක් ලියවිල්ලකින් මාසයක් කල් දීමෙන් පසු, මුළු ඉඩම හෝ එහි යම්කිසි කොටසක් දිසාපති තුමාට භාරදිය යුතුය. එසේ භාරගත් කොටස සඳහා ගණන් බැලූ මුදලක් ඉතිරි කාලයේ බද්ද සඳහා ඔහු විසින් ගෙවා ඇති මුදලෙන් අවසරපත්‍රකරුට ආපසු ගෙවනු ලැබේ.
(12) අවසරපත්‍රයේ සඳහන් මොනම කොන්දේසියක් හෝ කඩ කිරීම දිසාපතිතුමාගේ නියමයන් පිට අවසර පත්‍රය වහාම අවලංගු කර ඉඩම රජය වෙනුවෙන් භාර ගැනීමට හේතුවනු පමණක් නොව මොනම වන්දියක් හෝ නොගෙවා මෙ වෙනුවෙන් තබන ලද ඇප මුදල සම්පූර්ණයෙන් හෝ කොටසක් වත් ආපසු නොගෙවීමට හේතුවනු ඇත.
(13) ඉඩමට කරණ ලද වැඩිදියුණු කිරීම් හෝ වෙනත් මොනම කරුණක් නිසා හෝ වන්දි ඉල්ලීමට අවසරපත්‍රකරුට මොනම අයිතියක් හෝ නොමැත.
(14) අවසරපත්‍රකරු විසින් ඉඩමෙ තිබෙන රබර් ගස්වල කිරි කැපීම නාශක ක්‍රමයට නොකළ යුතුය.
(15) අවසරපත්‍රකරු විසින් රබර් පාලන ආඥාපණත යටතේ ගෙවීමට සිදුවන යම මුදලක් වේනොත් එය ඔහු විසින් ගෙවිය යුතුය.
(16) අවසරපත්‍රකරු විසින් රබර් කිරි කැපීම, නඩත්තු කිරීම, උදළුගෑම යන ආදී කෘෂිකාර්මික කටයුතු ක්‍රමානුකූලව කිරීම යනාදිය දිසාපති තුමා සෑහීමට පත්වන අන්දමට කළ යුතුය.

කේ. ජී. ඩී. ඩී. පතිරත්න,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1965.11.3 වැනි දින,
කළුතර, දිසාපති කාර්‍යාලයේ දී ය.

### උපලේඛනය

### කළුතර තොටමුනේ ප්‍රාදේශීය අදයම නිලධාරි කොට්ඨාශය

1965.12.22 දින පෙරවරු 10ට කළුතර ප්‍රාදේශීය ආදයම නිලධාරි කාර්‍යාලයේ දී වෙන්දේසි කරනු ලබන ඉඩම්

| ඉඩම පිහිටි ගම සහ බදු අංකය | ඉඩමෙ පිහිටීම ප්‍රමාණය සහ වගාව | මුළු ලංසුව රු. ශ. |
|---|---|---|
| 1. කටුකුරුන්ද—ඒඇල්/46/ටී | ... කටුකුරුන්දේ ධීවර කාර්මිකයින්ගේ නිවාස යෝජනා ක්‍රමය සඳහා රජයට අත්පත් කරගන්නා ලද ඉඩමෙ ඇති පොල්ගස් 75ක පමණ පලදාව භුක්ති විඳීම. | 232 50 |
| 2. උග්ගල්බොඩ—ඒඇල්/41/ටී | ... මූලික පිතියම අංක : 17156, කට්ටි අංකය : 1 සහ 2, අ. 4 රූ. 1 ප. 07.3—පොල්ගස් යනාදිය ... | 135 0 |

### රයිගම් කෝරලයේ ප්‍රාදේශීය ආදයම නිලධාරි කොට්ඨාශය

1965.12.22වන දින පෙරවරු 10ට හොරණ ප්‍රාදේශීය ආදයම නිලධාරි කාර්‍යාලයේ දී වෙන්දේසි කරනු ලබන ඉඩම්

| | | |
|---|---|---|
| 1. මාපුටුගල—ඒඇල්/71/ආර් | ... මූ. පි. ඒ. 3704 දෙළ රක්ෂිත බිම, අ. 1 රූ. 1 ප. 00—රබර් ගස් ... ... | 128 25 |

### පස්දුන් කෝරලේබටහිර ප්‍රාදේශීය ආදයම නිලධාරි කොට්ඨාශය

1965.12.22 වන දින පෙරවරු 10ට මතුගම ප්‍රාදේශීය ආදයම නිලධාරි කාර්‍යාලයේ දී වෙන්දේසි කරනු ලබන ඉඩම්

| | | |
|---|---|---|
| 1. ඇලදුව—ඒඇල්/67/ඩබ් | ... මූ.පි. 13488, කට්ටි 22476, අ. 2 රූ.0 ප. 00—රබර් ගස් ... ... ... | 104 0 |
| 2. බදුගම—ඒඇල්/86/ඩබ් | ... මූ.පි. 16684, කට්ටි ටීපී. 184340 එකුමගොඩවත්ත ඇල රක්ෂිත බිම, අ. 5 රූ. 0. ප. 00—රබර් ගස් | 123 75 |
| 3. නැහින්න—ඒඇල්/132/ඩබ් | ... ක/නැහින්න රජයේ විදුහලට අයත් ඉඩමෙ පිහිටි පලදාව—රබර් ගස් 320, පොල් ගස් 8යි, කොස් ගස්1 යි | 100 0 |

### පානදුර තොටමුන ප්‍රාදේශීය ආදයම නිලධාරි කොට්ඨාශය

1965.12.22 වන දින පෙරවරු 10ට පානදුර ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්‍යාලයේ දී වෙන්දේසි කරනු ලබන ඉඩම්

| | | |
|---|---|---|
| 1. දියගම—ඒඇල්/6/ටී | ... මූ.පි. 20250, කට්ටි 1 සිට 4, අ. 0 රූ. 2 .ප. 00—පොල් සහ කොස් ගස් ... ... | 104 0 |

අංකය : එල්.එල්.සී. 1447/66.

## දිසාපතිතුමා—රත්නපුර දිස්ත්‍රික්කය

### ශ්‍රීපාදස්ථානයට යන මාර්ගය දෙපස තිබෙන තාවකාලික වෙළඳසැල් (කඩ) බදුදීම

ශ්‍රීපාදස්ථානයට යන මාර්ගය දෙපස තිබෙන මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් රජයේ ඉඩම්, 1966 වන්දනා කාලයේදී තාවකාලික වෙළඳසැල් (කඩ) පැවැත්වීම සඳහා බදුදීම පිණිස මුද්‍රාව (සීල්) තබන ලද ඉල්ලුම් පත්‍ර "ටෙන්ඩර්" රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා විසින් භාරගනු ලැබේ. එක් එක් ඉඩම් කැබැල්ල වෙනුවෙන් වෙන වෙනම ඉල්ලුම් පත්‍ර එවිය යුතුවේ.

2. "ශ්‍රීපාදස්ථානයට යන මාර්ගයේ වෙළඳසැල් පැවැත්වීම සඳහා" යන වචන ලියුම් කවරයේ ලියා මුද්‍රාව තබන ලද ඉල්ලුම් පත්‍ර 1965 දෙසැම්බර් මස 10 වැනි දින පෙරවරු 10.30 වනතුරු භාරගෙන ඒ වේලාවට එම ලියුම් කඩා බලනු ලැබේ. ඉල්ලුම් පත්‍රයන්හි සත්‍යතාවය ඔප්පු කිරීම පිණිස ඉල්ලුම්කරු හෝ ඔහුගෙන් බලය ලත් ඒජන්ත කෙනෙක් ඒ වේලාවේ මෙම කච්චේරියට පැමිණිය යුතුයි.

3. ඉල්ලුම් කරන ලද එක් එක් ඉඩම් කැබැල්ලක් සඳහා රු. 25ක මුදලක් රත්නපුර කච්චේරියේ තැන්පත්කොට ඒ වෙනුවෙන් ලැබෙන කුවිතාන්සිය ඉල්ලුම් පත්‍රයට ඈමිණිය යුතුය.

4. තෝරා ගන්නා ලද ඉල්ලුම් පත්‍රයන්හි සඳහන් සම්පූර්ණ මුදල ඉල්ලුම්කරුවන් විසින් එවලේම ගෙවා බලපත්‍ර ලබාගත යුතුයි.

5. ඉල්ලුම් පත්‍ර භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය දිසාපතිතුමා තබා ගන්නා ලදී.

6. යම්කිසි ඉඩම් කැබෙල්ලක් සඳහා ලැබී තිබෙන ඉල්ලුම්පත්‍ර නුසුදුසුවේ නම්, එවැනි ඉඩම් බදු වෙන්දේසි කිරීමේ බලය දිසාපතිතුමා වෙත වේ.

7. සෑම කඩ බිමකම ගොඩනැගිලි 1966 ජනවාරි 31 වැනි දිනට පෙර සාදා නිම කිරීමට කටයුතු නොකළහොත් එවැනි බිම් කට්ටි නැවත වෙන්දේසි කිරීමේ බලය දිසාපතිතුමා වෙත වේ.

8. තෝරාගනු ලැබූ ඉල්ලුම්කරු විසින් තම වෙළඳසැලේ තිබෙන සෑම කෑම ද්‍රව්‍ය, මැස්සන්ගෙන් ප්‍රවේසම්වීම සඳහා සුදුසු ආවරණ තැබිය යුතුයි. එසේ නොකළහොත් එම බදුකරය අවලංගු කිරීමට දිසාපතිතුමාට බලය තිබේ.

9. තෝරාගනු ලැබූ සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම තමා විසින් සාදන සෑම වෙළඳසැලක් සඳහා සෞඛ්‍ය නිලධාරින් අනුමත කරන පරිදි සිමෙන්ති කක්කුස්සි ලෑලි තබන ලද වැසිකිළියක් බැගින් සෑදිය යුතුවේ. එසේ කිරීමට ඇප වශයෙන් රුපියල් 25ක් එම ඉල්ලුම්කරු විසින් තැන්පත් කළ යුතුයි. 1966 ජනවාරි 5 වැනිදසින් පෙර එවැනි වැසිකිළි තැනුවහොත් ඒ මුදල ආපසු දෙනු ලැබේ. එසේ නොකළහොත් වැසිකිළි තැනීම සඳහා එම මුදල් පාවිච්චි කරනු ලැබේ.

10. බදු ගන්නා ලද සෑම ඉඩම් කැබෙල්ලකින්ම 1966 ජූනි මස 1 වැනිදසින් පෙර අස්විය යුතුයි.

11. වැඩි විස්තර උවමනා කෙරේ නම්, රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපතිතුමාගෙන් දැනගත හැකිය.

### උපලේඛනය

(1) නිලිහෙල බිම් කැබලි 2 යි. එකක් මාර්ගය යටිපැත්තේ, අනික අම්බලම යාව.

(2) ගැටනැතුල, ඉඩම් කැබලි 1යි.

(3) ඉදිකටුපාන ගල්පොත්ත, ඉඩම් කැබලි 1යි.

(4) මැල්ල මලකඳුර, ඉඩම් කැබලි 1යි.

(5) පාවනැල්ල, ඉඩම් කැබලි 1යි.

(6) එරත්න-තුම්මෝදර, ඉඩම් කැබලි 2යි. එකක් එරත්න තුන් මෝදර, අනික තුන්මෝදර ගඟින් එතර එරත්න පාර.

(7) ධර්මරාජ ගල, ඉඩම් කැබලි 1යි.

(8) මැදගින්න, ඉඩම් කැබලි 1යි.

(9) සීතගඟුල, ඉඩම් කැබලි 1යි.

(10) එරත්න පාරේ බේරුමණ්ඩිය ගල්ලැල්ල, ඉඩම් කැබලි 1යි.

(11) ගැටනැතුල ඉස්මත්ත පොඩිය ගාව, ඉඩම් කැබලි 1යි.

(12) හැරමිටිපාන සහ මැල්ලමලකඳුර අතර ගෝනතැන්න, හෙළ තැන්න, ඉඩම් කැබලි 1යි.

(13) මස්කෙළිය ගඟ අසල 436 ජලෑනේ ලොට් 5, ඉඩම් කැබලි 1යි.

(14) ඉදිකටුපාන-එරත්න පාර, ඉඩම් කැබලි 1යි.

(15) ඉහළ පාවනැල්ල සහ නිලිහෙල අතර දුලුන්වෙල්ඩෝවේ අඩිපාර, ශ්‍රීපාදස්ථානය පාරට වැටෙන ස්ථානය.

(16) ආඩියමලතැන්න, ඉඩම් කැබලි 1යි.

(17) ගුරුගල්හෙල ඉස්මත්ත, ඉඩම් කැබලි 1යි.

(18) දෙමළගින්න තැන්න, ඉඩම් කැබලි 1යි.

(19) දියබෙත්මෙනෝනාගේ අම්බලම ළඟ, ඉඩම් කැබලි 1යි.

(20) පාවනැල්ල—433 ජලෑනේ ලොට් නො. 30, ඉඩම් කැබලි 1යි.

(21) මාපනාන—435 ජලෑනේ ලොට් නො. 5, ඉඩම් කැබලි 1යි.

(22) සුදුවැල්ල—ඩිතගඟුල ඉඩම් කැබලි 1යි.

(23) පලාබද්දල—කළුගඟේ පාලම අසල 439 ජලෑනේ ලොට් නො. 749, බිම් කැබලි 1යි.

(24) මිනුවන්කඳුරේ තොටුපළ ළඟ, 435 ජලෑනේ ලොට් නො. 19, බිම් කැබලි 1යි.

(25) හැරමිටියානේ මකරතොරන ළඟ, බිම් කැබලි 1යි. (තොරනේ සිට අඩි 60ක් ඇතුළත වෙළඳසැල් නොසෑදිය යුතුයි).

(26) හැරමිටිපානේ "මහෝපකාර කඩබිම".

වී. ර. බ. රාජකරුණා,
උප දිසාපති,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා වෙනුවට.

1965 ඔක්තෝබර් මස 28 වැනි දින,
රත්නපුර දිසාපති කාර්යාලයේ දිය.

11-304—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : 4/8/1819
දිසාපතිගේ අංකය : එල්.ජී/435.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

යාපනය දිස්ත්‍රික්කයේ පූනකරි ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයට අයත් මඩ්ඩුවිල් නාඩු ගමෙහි පිහිටි අංක ඒ 985 දරණ මූලික පිඹුරේ ප්‍රමාණයෙන් අක්කර 0, රූ. 0, පර්චස් 27.7 ක් පමණවූ අංක 4 දරණ රජයේ ඉඩම් කැබැල්ල කාර්යාලයක්, ගබඩාවක් හා විකුණුම් කාමරයක් සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම පිණිස ලියාපදිංචි අංක ජේ. ඊ. 152/17.11.58 දරණ සීමාසහිත පූනකරි විවිධ සේවා සමුපකාර සමිති සංගමය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

2. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදුදීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතරව පහත සඳහන් කොන්දේසි වලටද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) කාලය.—අවුරුදු 30 යි.

(ආ) බද්ද.—අවුරුද්දකට රු. 16.80 යි.

(ඇ) බදු ගන්නා විසින් බද්ද ඇරඹුනු දින සිට අවුරුදු එකක් ඇතුළත දී යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති තැනගේ සිත් ගන්නා පරිදි එකී ඉඩමෙහි පූනකරි විවිධ සේවා සමුපකාර සමිති සංගමයට අවශ්‍ය කාර්යාලයක්, ගබඩාවක් හා විකුණුම් කාමරයක් සඳහා අවශ්‍ය ගොඩනැගිලි තනා නිම කළ යුතුයි.

(ඈ) බදු ගන්නා විසින් මෙම ඉඩම සංගමයට අවශ්‍ය කාර්යාලය, ගබඩාව හා විකුණුම් කාමරය සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුයි.

3. මෙහි පහත සඳහන් දින සිට සති 6 ක් ඇතුලතදී මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩී. කේ. වී. බී. රණසිංහ,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1965 නොවැම්බර් මස 12 වැනි දින,
කොළඹ, ඉඩම් කොමසාරිස් කාර්යාලයේදිය.

11-333—65.11.12 දින අංක 14,554 දරණ ගැසට් පත්‍රය

මගේ අංකය : 4/8/1858
දිසාපතිගේ අංකය : එල්/ඇමඇස්/ඊපී/710

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනෙයි දකුණ සහ එරුවිල් පොරතිව් පත්තු ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කුරුක්කාල්මඩම් ගමෙහි පිහිටි අක්. 0, රූ. 1, ප. 0 පමණ වූ රජයේ ඉඩම කාර්‍යාලයක් සහ ගබඩාවක් ඉදිකිරීම පිණිස ලියාපදිංචි අංක බීසී/16 දරණ කුරුක්කාල්මඩම් විවිධ සේවා සමූපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

2. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :—

උතුරට : පාරක් ;
දකුණට : ගම්සභා පාර ;
නැගෙනහිරට : පාරක් ;
බටහිරට : පාරක්.

3. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතරව පහත සඳහන් කොන්දේසිවලටද යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) කාලය : අවුරුදු 30 යි.

(ආ) බද්ද : අවුරුද්දකට රු. 2 යි.

(ඇ) බදු ගන්නා විසින් බද්ද ඇරඹුණු දින සිට මාස 6ක් ඇතුලතදී මඩකලපුවේ දිසාපතිතැනගේ සිත් ගන්නා පරිදි එකී ඉඩමෙහි කුරුක්කාල්මඩම විවිධ සේවා සමූපකාර සමිතියට අවශ්‍ය කාර්‍යාලයක් සහ ගබඩාවක් තනා නිම කළ යුතුයි.

(ඈ) බදු ගන්නා විසින් මෙම ඉඩම සමිතියට අවශ්‍ය කාර්‍යාලයක් සහ ගබඩාවක් තැනීම පිණිස මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුයි.

4. පහත සඳහන් දින සිට සති හයක් ඇතුලතදී මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

සී. ජේ. වී. බී. රණසිංහ,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1965 නොවැම්බර් මස 12 දින,
කොළඹ, ඉඩම් කොමසාරිස් කාර්‍යාලයේ දිය.

11-334—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## මැණික් ගැරීමේ අයිතිය වෙන්දේසියේ විකිණීම

රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා විසින් පහත දක්වෙන උප ලේඛනයේ විස්තරකර තිබෙන රජයේ ඉඩම්වල මැණික් ගැරීමේ අයිතිය අවුරුද්දකට බදුදීම පිණිස ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. 1965 දෙසැම්බර් මස 5 වැනි දින පෙරවරු 9ට රත්නපුර දිසාපති කාර්යාලයේදී මෙම වෙන්දේසිය ආරම්භ කරනු ලැබේ.

3. වෙන්දේසියේදී බිම් කට්ටි ඉල්ලුම් කිරීමට අදහස් කරන අයවලුන් විසින් තම ඉල්ලීම පිළිගනු ලැබුවහොත් තමා විසින් ඉල්ලුම් කරන ලද මුදල් සම්පූර්ණයෙන් එම අවස්ථාවේදීම ගෙවීමට සූදානමින් පැමිණිය යුතුයි.

4. වෙන්දේසියේදී ඉඩම ලබාගත් අය ඉහළම ලන්සුව වහාම ගෙවිය යුතුවන අතර අතිරේකව තැන්පත් මුදල වශයෙන් රුපියල් 100ක් බැදිය යුතුයි. එම මුදල සඳහා කුවිතාන්සියක් ලබාගෙන බදු ගිවිසුමකට බැදිය යුතුයි. මැණික් ගැරීමේදී කණිනු ලබන වළවල් ආදිය ගොඩකිරීම සඳහාත් බදු ඔප්පුවේ සඳහන් කොන්දේසි හරියාකාර පිළිපැදීම සඳහාත් එම ඇපය තැන්පත් කළ යුතුයි. බදු ඔප්පුවේ කොන්දේසි හරියාකාර පිළිපැද කණින ලද වළවල්ද නිසි ආකාර ගොඩකළ පසු තැන්පත් කරන ලද ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

5. ඉඩම් ලබාගත් අයවලුන්ට ඉඩමේ භුක්තිය භාරදෙනු ලබන දිනය වෙන්දේසිය අවසානයේදී දැනුම් දෙනු ලැබේ.

6. බදු ගත් කාලසීමාව තුළදී ඉඩමේ පිහිටි ගස් කොළන් ආදිය කපා, උදුරා හෝ වෙනත් අන්දමකින් අලාභ හානියක් සිදුකළහොත් ඒ සඳහා වන්දි මුදල් ගෙවීමට ගැනුම්කරුට සිදු වේ.

7. බදු ගැණුම්කරු විසින් ඉඩමේ පතල් කැපීම ආරම්භ කිරීමට පෙර ඒ බව භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂ වෙත ලියාපදිංචි කරන ලද තැපෑලෙන් දන්වා යැවිය යුතුයි. ඔහුගේ ලිපිනය : භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂක, භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව, කොළඹ 2 ය. උවමනා අවස්ථාවකදී එම නිලධාරිතුමාට මැණික් ගැරීමේ වැඩ කටයුතු පරීක්ෂා කර බැලීමට ඉඩදිය යුතුයි.

8. ඉඩම් විකුණනු ලැබූ පසු එය රජයේ උවමනාවන්ට අවශ්‍යවී තිබී වැරදීමකින් හෝ නැතහොත් වෙන යම් කරුණක් නිසා විකුණනු ලැබූ බව වැටහුනොත් දිසාපතිතුමා විසින් බදු බලපත්‍රය අවලංගු කරනු ලැබේ. එසේ කිරීමේදී ගැනුම්කරුට තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. වෙනත් අලාභයක් හෝ ආධාරයක් නැතහොත් වන්දි මුදලක් වශයෙන් යම්කිසි මුදලක් ගෙවනු නොලැබේ.

9. ඉඩම්වල මැණික් ඇති බවට වගකියනු නොලැබේ.

10. මේ පිළිබඳව වැඩි විස්තර රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපතිතුමාගෙන් ලබාගත හැක.

වි. ර. බ. රාජකරුණා,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1965 නොවැම්බර් මස 4 වැනි දින,
රත්නපුර දිසාපති කාර්යාලයේ දිය.

### වෙන්දේසි කිරීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර

### (1) අටකලන් කෝරලය

1. අටකලන් කෝරලේ අංක 27 දරණ අවසාන ගම් සීතියමේ යටාගර ගමේ නෙළුගල් ඇල්ල දොලේ දිගින් දම්වැල් 30 ක ප්‍රමාණයට මායිම :—

උතුරට : දොලේ දකුණු ඉවුර ;
දකුණට : දොලේ වම් ඉවුර ;
නැගෙනහිරට : ලොට් 15 ;
බටහිරට : දොලේ වම් ඉවුර.

2. අටකලන් කෝරලේ අංක 27 දරණ අවසාන ගම් සීතියමේ යටාගර ගමේ දොම්පෙකන්ද දොලේ දිගින් දම්වැල් 30ක ප්‍රමාණයට මායිම :—

උතුරට : දොලේ ඉතිරි කොටස ;
දකුණට : ලොට් 18—අතුර ;
නැගෙනහිරට : දකුණු ඉවුර ;
බටහිරට : වම් ඉවුර.

3. අටකලන් කෝරලේ අංක 19 දරණ අවසාන ගම් සීතියමේ මඩලගම ගමේ හංගමුව ගඟේ දිගින් දම්වැල් 30ක ප්‍රමාණයට මායිම :—

උතුරට : දකුණු ඉවුර ;
දකුණට : වම් ඉවුර ;
නැගෙනහිරට : ගඟේ ඉතිරි කොටස ;
බටහිරට : ගඟේ ඉතිරි කොටස.

4. අටකලන් කෝරලේ අංක 19 දරණ අවසාන ගම් සීතියමේ මඩලගම ගමේ හංගමුව ගඟේ දිගින් දම්වැල් 30ක ප්‍රමාණයට මායිම :—

උතුරට : දකුණු ඉවුර ;
දකුණට : වම් ඉවුර ;
නැගෙනහිරට : ගඟේ ඉතිරි කොටස :
බටහිරට : ගඟේ ඉතිරි කොටස.

5. අටකලන් කෝරලේ අංක 19 දරණ අවසාන ගම් සීතියමේ මඩලගම ගමේ හංගමුව ගඟේ දිගින් දම්වැල් 30ක ප්‍රමාණයට මායිම :—

උතුරට : ගඟේ ඉතිරි කොටස ;
දකුණට : ඇන්දාන ගම් මායිම ;
නැගෙනහිරට : දකුණු ඉවුර ;
බටහිරට : වම් ඉවුර.

6. අටකලන් කෝරලේ අංක 19 දරණ අවසාන ගම් සීතියමේ මඩලගම ගමේ හංගමුව ගඟේ දිගින් දම්වැල් 30ක ප්‍රමාණයට මායිම :—

උතුරට : දකුණු ගංඉවුර ;
දකුණට : ගඟේ ඉතිරි කොටස ;
නැගෙනහිරට : වම් ගංඉවුර ;
බටහිරට : ගඟේ ඉතිරි කොටස.

7. අටකලන් කෝරලේ අංක 606 දරණ අවසාන ගම් සිතියමේ මාදම්පේ ගමේ ලොට් අංක 385 දරණ දෙමුවාත ගගේ දිගින් දම්වැල් 20ක පමණ ප්‍රමාණයට මායිම් :—

උතුරට : කලල් ඇල්ල ගම් ඉම ;
දකුණට : පන්නිල ගම් ඉම ;
නැගෙනහිරට : ගගේ ඉතිරි කොටස සහ ලොට් 386 සහ 387 ඉඩම්.
බටහිරට : පන්නිල ගම් ඉම.

8. අටකලන් කෝරලේ අංක 10 දරණ අවසාන ගම් සිතියමේ කලල් ඇල්ල ගමේ ලොට් 76½ දරණ පනාපිටිය ගගේ දිගින් දම්වැල් 17ක ප්‍රමාණයට මායිම් :—

උතුරට : කිවුල් ඇල ගගට යාවෙන තැන ;
දකුණට : ඇලේ ඉතිරි කොටස ;
නැගෙනහිරට : දකුණු ගංඉවුර ;
බටහිරට : වම් ගං ඉවුර.

